ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව 2013
------------------------------------------------------------

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2003 අංක 15 දරන පනතින් හා 2011 අංක 45 දරන පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනතේ 26(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර බැංකුවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම
----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2. මූල්‍ය ප්‍රකාශන
-----------------

2.1 මතය
------

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

2.2.1 අවධාරණය කළ යුතු කරුණ
---------------------------------

බැංකුව ඉතා සීමිත තැන්පත්කරුවන් මත යැපෙන සහ එය ඉහළ ද්‍රවශීලතා අවදානමක පවතින බව දැක්වෙන ඉකුත් වර්ෂයේ සියයට 47 සමඟ සැසඳීමේදී, 2013 දෙසැම්බර් 31 දිනට බැංකුවේ තැන්පතුවලින් සියයට 42 කට වැඩි ප්‍රමාණයක් තැන්පත්කරුවන් විසි දෙනෙකුගේ අයිතිය මත පවතී. එම නිසා මෙම තත්ත්වය බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ අහිතකර බලපෑමක් ඇති කළ හැකි බව නිරීක්ෂණය විය.

2.2.2 නොසැසඳු වෙනස්කම්
--------------------------

2003 දෙසැම්බර් 31 දිනට ප්‍රතිමූල්‍ය ණය ශේෂයන් සම්බන්ධයෙන් පොදු ලෙජර් ශේෂ සහ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් (ශ්‍රී ලං ම බැ) ලැබුණු ශේෂ සනාථ කිරීම් අතර පහත සඳහන් වෙනස්කම් හඳුනා ගෙන තිබුණි.

| විස්තරය | පොදු ලෙජරය අනුව ශේෂය | ශ්‍රී ලංකා මහා බැංකුවේ ශේෂ සනාථ කිරීම් අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ඇමෙරිකා එක්සත් ජනපද ආධාර (යූඑස්ඒඅයිඩී) | 5,080,499 | 129,467 | 4,951,032 |
| ආසියානු සංවර්ධන බැංකුව 11 (ඒඩීබී 11) | 65,568,497 | 34,189,201 | 31,379,296 |

2.2.3 හඳුනා නොගත් තැන්පතු
--------------------------

එකතුව රු.3,054,126 ක් වූ හඳුනා නොගත් තැන්පතු මූල්‍ය ප්‍රකාශනවල කිසිදු හෙළිදරව් කිරීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස හඳුනාගෙන විවිධ ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

2.2.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යෝජිත ආදායම් ප්‍රභවයන් හා ගාස්තු

2013 සැප්තැම්බර් 26 හා 2013 ඔක්තෝබර් 31 දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2012 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ණය පරිපාලන ගාස්තු ලෙස සියළු හිග ණය මත නව ආදායම් ප්‍රභවයන් අය කිරීමට අනුමත කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් ලෙස රු. 88,382,116 ක් ගිණුම් ගත කර තිබුණි. කෙසේ වුවද 2013 දෙසැම්බර් 31 දිනට උපලබ්ධි නොවූ ණය පරිපාලන ගාස්තු රු.48,736,213 ක් බව නිරීක්ෂණය විය.

සමාජයේ ආර්ථික වශයෙන් අවාසිදායක අංශයන් සඳහා නිවාස සැපයීමට බැංකුව විසින් යෝජනා ක්‍රම සකස් කර ක්‍රියාත්මක කළ යුතු බවට දැක්වෙන 2003 අංක 15 දරන පනතින් හා 2011 අංක 45 දරන පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනතෙහි සඳහන් කාර්යය සමග මෙම කාර්යය පරස්පර බවද තවදුරටත් නිරීක්ෂණය විය.

සේවක අර්ථසාධක අරමුදල් ශේෂයන්ට එරෙහිව නිකුත් කරන ලද "ශ්‍රම උදාන ණය" සම්බන්ධයෙන් ගනුදෙනුකරුවන්ට කිසිදු ලිඛිත දැනුම්දීමක් සිදු කිරීමෙන් තොරව ණය පරිපාලන ගාස්තු ලෙස රු. 46,541,725 ක මුදලක් බැංකුව විසින් මහා බැංකුවෙන් ඉල්ලා ඇති බවද නිරීක්ෂණය විය.

(ආ) සේවක ප්‍රසාද දීමනා

බැංකුව විසින් 2012 වර්ෂය තුළදී සේවක ප්‍රසාද දීමනා ගෙවා නොතිබුණි. ඒ වෙනුවට බැංකුව විසින් එම කාර්යය සඳහා රු. 22,201,113 ක විශේෂ සේවක ණය පහසුකමක් ලබා දී තිබූ අතර 2012 වර්ෂය සඳහා පාඩුව වැඩිවීම වැලැක්වීම සඳහා "විශේෂ සේවක ණය" යටතේ වත්කමක් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. කෙසේ වුවද බැංකුව විසින් ඉහත සඳහන් "විශේෂ සේවක ණය" නිරවුල් කිරීමේ අරමුණින් 2013 වර්ෂයේදී රු. 23,026,123 ක අතිරේක සේවක ප්‍රසාද දීමනාවක් ලබා දී තිබුණි. එබැවින් බැංකුව විසින් එයට සමාන මුදලකින් අතිරේක වියදමක් දරා තිබුණි.

(ඇ) ටී ෂර්ට් මිලදී ගැනීම

2012 වර්ෂයේදී ටී- ෂර්ට් 1860 ක් සැපයීම සඳහා රු. 995,100 ක් වටිනාකම වූ ටෙන්ඩරයක් පුද්ගලික සමාගමකට ප්‍රදානය කර තිබුණි. පසුව සැපයුම්කරු ටී- ෂර්ට් සැපයීම ප්‍රතික්ෂේප කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අත්තිකාරමක් ගෙවීම සඳහා 2012 සැප්තැම්බර් 22 දින රු. 497,550 ක වටිනාකමට ලියන ලද චෙක්පත සැපයුම්කරුට භාරදීමෙන් තොරව මාස 06 කට ආසන්න කාලයක් පරිපාලන අංශයේ තබා තිබුණු අතර 2013 මාර්තු 21 දින අවලංගු කර තිබුණි.

(ii) කාර්යසාධන බැඳුම්කරයක් සැපයුම්කරුගෙන් ලබා ගෙන නොතිබුණි.

(iii) 2013 ඔක්තෝබර් 23 දින අපගේ භෞතික පරීක්ෂණයේදී, ප්‍රසම්පාදන ලියවිලිවල සඳහන් ලිපිනයේ එවැනි සමාගමක් නොපවතින බවත් සැපයුම්කරු බැංකුවේ ලියාපදිංචි සැපයුම්කරුවකු නොවන බවත් නිරීක්ෂණය විය. කෙසේ වුවද තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලියාපදිංචි සැපයුම් කරුවකු ලෙස සැපයුම්කරුගේ විස්තර ඉදිරිපත් කිරීමෙන් ප්‍රසම්පාදන කමිටුව නොමඟ යවා තිබුණි.

(ඈ) ආයෝජන දේපල

--------------------

(i) සංඝරාජ මාවතේ අංක 441 දරන ස්ථානයේ පර්චස් 59.20 ක ප්‍රමාණයේ ඉඩමක් 2012 හා 2013 වර්ෂවලදී පිළිවෙලින් රු. 53,081,000 ක් හා රු. 6,120,000 ක් වූ අතිරික්තයක් සහිතව ප්‍රත්‍යාගණනය කර තිබුණි. කෙසේ වුවද බැංකුවේ තක්සේරුකරු මණ්ඩලයේ 2013 දෙසැම්බර් 18 දිනැති තක්සේරු වාර්තාවට අනුව, ඉඩම හරහා මලාපවහන හා ජලාපවහන මාර්ග යෑම හේතුවෙන් එහි සම්පූර්ණ වෙළඳපොළ අගයට උපලබ්ධිවීම සඳහා යම් කිසි නීතිමය සීමාවක් ඇති විය හැක.

(ii) ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවෙන් මිලදී ගන්නා ලද ශ්‍රීමත් බණ්ඩාරනායක මාවතේ අංක 192 ස්ථානයේ පිහිටි පර්චස් 138.20 ක් වූ ඉඩම් දෙකක් 2012 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කර නොතිබුණි. බැංකුව විසින් 2013 වර්ෂයේදී මෙම දේපල රු. 145,112,000 ක අතිරික්තයක් සහිතව රු. 504,430,000 කට ප්‍රත්‍යාගණනය කර තිබුණි. කෙසේ වුවද ඉහත දේපලවල හිස් කොටසේ භුක්තිය සඳහා 2007 වර්ෂයේදී බැංකුව විසින් ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට නඩු පවරා තිබුණි. ඉහත නඩුවේ නියෝගය බැංකුවට වාසිවන ආකාරයට 2012 ඔක්තෝබර් 18 දින ලබාදී තිබුණි. මේ අතර තීන්දුවට එරෙහිව ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව විසින් අභියාචනයක් ඉදිරිපත් කර තිබුණි.

(ඉ) විශේෂ පාරිතෝෂිකය

------------------------

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 (සේවක ප්‍රතිලාභ) අනුව, කිසියම් අනාගත වගකීමක් සඳහා බැංකුව විසින් ප්‍රමාණවත් ප්‍රතිපාදන සැලසිය යුතුය. සේවා කාලය වසර 15 ට හෝ ඊට වැඩි කාලයක් සම්පූර්ණ කළ සේවකයන් සඳහා සාමාන්‍ය පාරිතෝෂිකයට අමතරව විශේෂ පාරිතෝෂික ගෙවීමක් බැංකුව විසින් එහි සේවකයන්ට 2007 වර්ෂයේ සිට, විශේෂ පාරිතෝෂික ගෙවීම පිළිබඳ ගිණුම්වල කිසිදු ප්‍රතිපාදනයක් සැලසීමෙන් තොරව ලබාදී තිබූ අතර එක් එක් වර්ෂය සඳහා කරන ලද ගෙවීම් සමාලෝචිත වර්ෂය දක්වා මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනැති ආයුගණක තක්සේරු වාර්තාවට අනුව, විශේෂ පාරිතෝෂික ගෙවීම පිළිබඳ තථ්‍ය බැරකම රු.92,820,161 ක් බවද තවදුරටත් නිරීක්ෂණය විය. කෙසේ වුවද බැංකුව විසින් බැරකමෙන් සියයට 50 ක් වූ රු. 46,410,080 ක් සඳහා පමණක් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනය කර තිබුණි.

(ඊ) සේවක කොටස් සැලැස්ම (Employee Share Option Plan)

-----------------------------------------------------------------

බැංකුව විසින් සේවක කොටස් සැලැස්ම (Employee Share Option Plan) යටතේ මූල්‍ය ගනුදෙනුවක බලපෑමක් නොමැතිව පුද්ගලික සමාගමක් මගින් කොටස් ප්‍රාග්ධනය හා අනිකුත් වත්කම් රු. 49,838,646 කින් වැඩිකර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 158.01 ක බදු පසු ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පසු ලාභය රු. මිලියන 55.53 ක් වූ හෙයින් රු. මිලියන 102.48 කින් හෙවත් සියයට 182 කින් බදු පසු ලාභය වැඩි වීමක් දැක්වුණි. ආයෝජන දේපල මත රු. මිලියන 95 කින් ප්‍රත්‍යාගණන වාසිය හඳුනාගැනීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලවල මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

3.2.1 මූල්‍ය ප්‍රතිඵලවල සාරාංශය

--------------------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සාරාංශයක් ඉකුත් වර්ෂය සමග සසඳා පහත දැක්වේ.

| විෂයය | 2013 | 2012 |
|---|---|---|
| | රු. මිලියන | රු.මිලියන |
| පොළී ආදායම | 3,528 | 2,635 |
| පොළී වියදම | (2,469) | (1,805) |
| ශුද්ධ පොළී ආදායම | 1,059 | 830 |
| පොළී නොවන ආදායම් | 275 | 109 |
| ශුද්ධ ආදායම | 1,334 | 939 |
| සේවක පිරිවැය | (586) | (458) |
| වෙනත් වියදම් | (352) | (304) |
| ණය සහ වෙනත් පාඩු සඳහා හානිකරණ ගාස්තු | (87) | (1) |
| බදු වලට පෙර මෙහෙයුම් ලාභය | 309 | 176 |
| එකතු කල අගය මත බදු | (78) | (50) |
| බදු වියදම | (73) | (70) |
| වර්ෂය සඳහා ලාභය | 158 | 56 |

ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී පොළී ආදායම හා පොළී වියදම පිළිවෙලින් සියයට 33.89 කින් හා සියයට 36.79 කින් වැඩි වී තිබූ අතර අනෙකුත් වියදම් සියයට 34.34 කින් වැඩි වී තිබුණි. මේ අතර පොළී නොවන ආදායම ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 152 කින් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා පොළී වියදම මත ශුද්ධ පොළී ආදායම සියයට 43 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ සියයට 46 සමඟ සැසඳීමේදී සියයට 3 ක පිරිහීමක් දැක්වුණි.

3.2.2 වැදගත් ගිණුම්කරණ අනුපාත

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ බැංකුවේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| | 2013 | 2012 |
|---|---|---|
| | % | % |
| **ලාභදායිත්ව අනුපාත** | | |
| (i) ශුද්ධ ලාභ අනුපාතය | 4.15 | 2.02 |
| (ii) පොළී ආදායමට ශුද්ධ පොලී ආදායම | 30.01 | 31.48 |
| (iii) පොළී ආදායමට පොලී පිරිවැය | 69.99 | 68.52 |
| (iv) ශුද්ධ පොළී ආදායමට පොදු කාර්ය වියදම් | 88.55 | 91.86 |
| (v) සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභය | 0.65 | 0.27 |
| (vi) ස්කන්ධය මත ප්‍රතිලාභය | 6.36 | 2.35 |
| (vii) කොටසක ඉපැයුම (රු) | 2.44 | 0.86 |
| **ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතය** | | |
| (i) මුළු වත්කම්වලට ස්කන්ධය | 9.34 | 11.50 |
| (ii) ණයවලට ස්කන්ධය | 49.04 | 74.40 |
| (iii) පෙළ i (ශ්‍රී ලං ම බැ සම්මතය 5%) | 17.74 | 23.75 |
| (iv) පෙළ ii (ශ්‍රී ලං ම බැ සම්මතය 10%) | 18.29 | 24.41 |
| **ද්‍රවශීලතා වත්කම් අනුපාත** | 28.74 | 22.65 |
| ද්‍රවශීලතා වත්කම් අනුපාතය (අවමය 20%) | | |

3.3 මෙහෙයුම් සමාලෝචනය

3.3.1 අරමුදල් පිරිවැය සහ ප්‍රතිලාභ

| විස්තරය | සමුච්චිත පිරිවැය සහ ආදායම් පදනම මත | | |
|---|---|---|---|
| | සාමාන්‍ය ශේෂය | පිරිවැය/ ආදායම | අනුපාතය |
| | රු. '000 | රු. '000 | (%) |
| **තැන්පතු** | | | |
| ඉතුරුම් තැන්පතු | 2,084,635 | 99,892 | 4.79 |
| ස්ථාවර තැන්පතු | 13,445,900 | 2,016,254 | 15.00 |
| ධන නිධාන | 402,418 | 44,228 | 10.99 |
| වෙනත් තැන්පතු | 5,707 | 269 | 4.72 |
| **තැන්පතුවල උප එකතුව** | 16,631,592 | 2,160,643 | 12.99 |
| **ණය ගැනීම්** | | | |

<u>**වාණිජමය ණය ගැනීම්**</u>

| | | | |
|---|---|---|---|
| බැංකු අයිරාව | 67,901 | 1,119 | 1.65 |
| වෙළඳ පොළින් ණය ගැනීම් | 2,036,449 | 217,943 | 10.70 |
| **වාණිජමය ණය ගැනීම්වල උප එකතුව** | 2,104,350 | 219,062 | 10.41 |
| **වෙනත් ණය ගැනීම්** | | | |
| විශේෂ ණය යෝජනා ක්‍රම | 1,060,985 | 37,482 | 3.53 |
| ප්‍රතිමූල්‍ය ණය | 991,864 | 52,081 | 5.25 |
| **වෙනත් ණය ගැනීම්වල උප එකතුව** | 2,052,849 | 89,563 | 4.36 |
| වලනය මත අරමුදල්වල පිරිවැය | 18,735,943 | 2,379,705 | 12.70 |
| වෙනත් වගකීම් | 2,888,175 | - | - |
| ප්‍රාග්ධනය | 962,093 | - | - |
| සංචිත | 1,519,289 | - | - |
| **අඩුකළා :** | 24,116,500 | 3,414,722 | 14.16 |
| වෙනත් වත්කම් | 1,391,714 | - | - |
| මූල්‍ය පිරිවැය | 22,724,785 | 2,469,268 | 10.87 |
| පොදු කාර්යය පිරිවැය | 22,724,785 | 1,035,017 | 4.55 |
| **අරමුදල්වල මුළු පිරිවැය** | 22,724,785 | 3,504,285 | 15.42 |
| ණය කළඹ | 17,833,503 | 2,922,126 | 16.39 |
| ආයෝජන | 4,905,406 | 606,091 | 12.36 |
| **මූල්‍ය ප්‍රතිලාභය - කාර්යසාධනය** | 22,738,910 | 3,528,217 | 15.52 |
| ආන්තිකය | 22,738,910 | 23,932 | 0.11 |
| ගාස්තු පදනම් වෙනත් ආදායම | 22,738,910 | 285,360 | 1.25 |
| **ආන්තිකය** | 22,738,910 | 309,292 | 1.36 |
| බදු | 22,738,910 | 151,284 | 0.67 |
| **ශුද්ධ ආන්තිකය** | 22,738,910 | 158,008 | 0.69 |

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අරමුදල් පිරිවැය හා ප්‍රතිලාභ වාර්තාව අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිලාභය (ණය සහ ආයෝජන) සියයට 15.52 ක් වූ අතර බැංකුව විසින් 2013 වර්ෂයේ සාමාන්‍ය මූල්‍ය ප්‍රතිලාභයට වඩා ඉතා ඉහළින් වූ සියයට 18 ක පොලී අනුපාතයකට රු. මිලියන 1,700 ක මුදලක් ලංචිම අර්ථසාධක අරමුදලින් ලබාගෙන තිබුණි.

3.3.2 බැංකුවේ පරිණතවීම් ව්‍යුහය
--------------------------------

බැංකුවේ වත්කම් සහ වගකීම් ව්‍යුහය මාසික මට්ටමින් විශ්ලේෂණය කිරීමේදී මුළු වගකීම් ඉතා වැඩි බවත් සමාලෝචිත වර්ෂයේ කෙටිකාලීන ද්‍රවශීලතා පරතරය මාස 03 ක් දක්වා හා මාස 03 සිට 12 දක්වා පිළිවෙලින් රු. මිලියන 4,703 ක හා රු. මිලියන 3,174 ක සෘණ පරතරයක් බවත් අනාවරණය විය. විස්තර පහත දැක්වේ.

| | 2013 දෙසැම්බර් 31 දිනට | | | | | |
|---|---|---|---|---|---|---|
| | මාස 3 දක්වා | මාස 3 සිට 12 දක්වා | වර්ෂ 1 සිට 3 දක්වා | වර්ෂ 3 සිට 5 දක්වා | වර්ෂ 5ට වැඩි | එකතුව |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| <u>**වත්කම්**</u> | | | | | | |
| මුදල් | 101,867 | - | - | - | - | 101,867 |
| බැංකු වලින් ලැබිය යුතු | 166,223 | - | - | - | - | 166,223 |
| ආයෝජන | 4,304,569 | 1,941,389 | 87,313 | - | 31 | 6,333,302 |
| ණය සහ අත්තිකාරම් | 1,112,307 | 1,545,735 | 4,749.714 | 4,138,321 | 8,155,262 | 19,701,339 |
| ස්ථාවර වත්කම් | - | - | - | - | 289,537 | 289,537 |
| වෙනත් වත්කම් | 29,222 | 23,919 | 76,580 | 20,036 | 825,457 | 975,213 |
| **මුළු වත්කම්** | 5,714,188 | 3,511,043 | 4,913,607 | 4,158,356 | 9,270,287 | 27,567,481 |
| <u>**වගකීම්**</u> | | | | | | |
| මුළු ප්‍රාග්ධන අරමුදල | - | - | - | - | 2,575,222 | 2,575,222 |
| තැන්පතු | 9,161,038 | 6,297,743 | 1,383,766 | 1,369,640 | 701,460 | 18,913,646 |
| ණය ගැනීම් | 613,171 | 385,244 | 1,232,143 | 1,763,202 | 1,257,928 | 5,251,689 |
| වෙනත් වගකීම් | 642,969 | 1,597 | 7,526 | 165,654 | 9,178 | 826,924 |
| **මුළු වගකීම්** | 10,417,178 | 6,684,584 | 2,623,435 | 3,298,496 | 4,543,788 | 27,567,481 |
| **පරිණතවීම් පරතරය** | (4,702,990) | (3,173,541) | 2,290,172 | 859,860 | 4,726,499 | නැත |

4. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති සහ පාලන දුර්වලතා මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මගින් බැංකුවේ සභාපතිනියගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ආයෝජන දේපල
(ආ) අරමුදල් පිරිවැය
(ඇ) යෝජිත ආදායම් ප්‍රභවයන් හා ගාස්තු
(ඈ) ණය පරිපාලනය
(ඉ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ
(ඊ) මානව සම්පත් කළමනාකරණය